# Trial Monitoring report

**About the case:** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම සබැඳි නඩුව

**Case no. : HC 107/21 (TAB)**

**Courts:** පුත්තලම මහාධිකරණය

**Date of hearing: 2024.06.26**

**Author (s) of report:** මාධව ඊරියගම

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා<br>විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා<br>විනිසුරු නයෝමි වික්‍රමසේකර | |
| **Attorney General's Dept.** | ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක සමඟ රජයේ අධිනීතිඥ ඉසුරි ජයවරධන | |
| **Police (CID / TID etc.)** | **CID Colombo** | |
| **Accused / Suspects** | 1. අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් අබු දහිදා<br>2. අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් අබු සාෆියා<br>3. මොහොමඩ් සරීෆු ආදම් ලෙබ්බේ හෙවත් ගෆූර් මාමා / ගෆූර් නානා හෙවත් අබු හදීද්<br>4. මොහොමඩ් ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත් සාදික් අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු නවුෆර් හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද් | |

| | | |
|---|---|---|
| | **6.** මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| **Lawyers for accused / suspects** | 1,2,4 චූදිතයින් වෙනුවෙන් ශක්මි ෆාරිඩ් මහතා සමඟ නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා.<br><br>3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් මහතා<br><br>5 වන චූදිත වෙනුවෙන් රජයෙන් පත්කළ නීතිඥ අද්නාත් ෆසාල් මහතා<br><br>6 වන චූදිත වෙනුවෙන් ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතිඥ ශක්මි ෆාරිඩ් මහතා | |
| **Aggrieved party** | - | |
| **Lawyers for aggrieved party** | - | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | - | |
| **Others** | - | |
| | | |

## 2. What happened in court hearing?

("පැමිණිල්ල" යන්නෙන් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි ජෙයෂ්ට රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා ද "විත්තිය" යන්නෙන් 3 වන විත්තිකරු වෙනුවෙන් පෙනී සිටි ඒ.එච්.එම් අල්තාෆ් මහතා ද අරුත් ගැන්වෙන බව සළකන්න)

මෙදින තුන්වන විත්තිකරුගේ සාක්ෂිකරුවෙකු වශයෙන් කේ. උමාපති වෛද්‍යවරයා සාක්ෂි ලබා දීම සඳහා කැඳවන ලද අතර ඔහු වයස අවුරුදු 47ක් පමණ වන කොළඹ ජාතික රෝහලේ විකලාංග විශේෂඥ ශල්‍ය වෛද්‍යවරයෙකි. සිය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විත්තිය විසින් මූලික ප්‍රශ්න විමසූ අතර අදාළ වෛද්‍යවරයා 2020.02.04 දින සිට කොළඹ ජාතික රෝහලේ සේවය කළ බවත් ඔහු මෙම අධිකරණය වෙත කැඳවා ඇත්තේ ඔහු විසින්

ජාතික රෝහ්ලේදී 3 වන විත්තිකරු පරීක්ෂා කිරීම පිළිබඳ සාක්ෂි ලබා දීම සඳහා බවත් ප්‍රකාශ කරන ලදී.

එහිදී වෛද්‍යවරයාගේ සුදුසුකම්, පළපුරුද්ද, විකලාංගවේදය පිළිබඳ විශේෂඥ මතය ප්‍රකාශ කිරීමේ හැකියාව විත්තිය විසින් යෝජනා කිරීමෙන් අනතුරුව අපරාධ නඩු විධාන සංග්‍රහයේ 420 වගන්තිය යටතේ පිළිගැනීමක් ලෙස සටහන් කළ අතර වෛද්‍යවරයා විසින් දෙනු ලබන සාක්ෂි පිළිගැනීම් ලෙස සටහන් කළ හැකි බව වැඩිදුරටත් පැමිණිල්ල වෙනුවෙන් දන්වා සිටින ලදී.

මෙහිදී වෛද්‍යවරයා විසින් සාක්ෂි ලබා දෙමින් ඔහු මෙම 3 වන විත්තිකරු රෝගියෙකු වශයෙන් පරීක්ෂා කළ බව පිළිගත් අතර මෙම තැනැත්තා කොළඹ ජාතික රෝහලේ 72 වාට්ටුවට ඇතුළත් කල පසු එම රෝගියාගේ රෝග ස්වභාවය අනුව තමා වෙතද යොමු කර ඇති බවත් රෝග විනිශ්චය පතෙහි තමන්ගේ නමද අනෙකුත් වෛද්‍යවරුන්ගේ නම් අතර සටහන්ව ඇති බවත් ඔහු විසින් හඳුනා ගන්නා ලද අතර එම 3 වි 7 ලෙස ලකුණු කරන ලද රෝග විනිශ්චය පත වෛද්‍යවරයා වෙත හඳුනාගැනීම සඳහා විත්තිය විසින් ඉදිරිපත් කරන ලදී.

එහිදී වැඩිදුරටත් මූලික ප්‍රශ්න කිරීම් මෙම රෝගියා සම්බන්ධයෙන් යම් අස්ථි භග්නයක් හෝ ඒ ආශ්‍රිත තත්වයක් තිබුනේද යන්න ඉලක්ක කරමින් විමසූ අතර එහිදී ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කලේ එවැනි බරපතළ තත්වයක් විත්තිකරු වෙතින් දිස් නොවූ බැවින් ඔහු තමන් වෙත නිරීක්ෂණය කළ අවස්ථාවේ වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොවූ බවයි. තවද තමන් වෙත රෝගියා ඉදිරිපත් කළ අවස්ථාවේ ඔහුට CT පරීක්ෂණයක් ද සිදු කර තිබූ හෙයින් එම පරීක්ෂණය අනුවද කිසිදු බරපතළ තත්වයක් අනාවරණය වී නොමැති බැවින් රෝගියා තම වාට්ටුවට මාරු කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බව ඔහු පැවසීය.

එහිදී මූලික සාක්ෂි විමසමින් විත්තිය විසින් රෝගියා සාක්ෂිකරු විසින් කිසියම් විශේෂඥයෙකු වෙත යොමු කිරීමේ තීරණයක් ගෙන ඇතිදැයි විමසීය. එහිදී කරුණු පැහැදිලි කරමින් අදාළ රෝගියා පරීක්ෂා කළ වෛද්‍යවරයා විසින් රෝග විනිශ්චය පතෙහි "Head Injury Observation" ලෙස දක්වා ඇත්තේ එය සුලු තත්වයක් පමණක් වන බැවින් බවත් අභ්‍යන්තරයේ තුවාල පවතී නම් මෙලෙස ලියා දැක්වීමක් සිදු නොකරන බවත් පැවසූ අතර විශේෂයෙන්ම තමා 3 වන විත්තිකරු රෝගියෙකු වශයෙන් පරීක්ෂා කරන ලද අවස්ථාවේ ඇස අසල මැහුම් දමා තිබූ බවත් තමාගේ විෂය ක්ෂේත්‍රය වන විකලාංගවේදයට අදාලව තවදුරටත් එම රෝගියාට ප්‍රතිකාර අවශ්‍ය නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.

එහිදී විත්තිය විසින් 3 වන චූදිතගේ අක්ෂි සටහන් පිළිබඳ ලකුණු කරන ලද ලේඛන පෙන්වා සිටීමට උත්සහා දරණ ලද අතර එහිදි අධිකරණය විසින් මෙම වෛද්‍යවරයා අක්ෂි විශේෂඥයෙකු නොවන බවත් 3 වන චූදිතට අදාලව ඔහු විසින් සිදු කල කාර්‍ය කුමක්ද යන්න දැනටමත් පැහැදිලිකර ඇති බව පැවසීය.

එසේම වැඩිදුරටත් පිලිතුරු දෙමින් සාක්ෂිකරු නැවත මෙම රෝගියා ගෙන්වා ගැනීමට අවශ්‍යතාවයක් නොවූ බවත් විකලාංගවේදය ආශ්‍රිත කිසිදු ගැටලුවක් ඔහුට නොපැවති බවත් අධිකරණය වෙත දන්වන ලදි.

විශේෂයෙන් පැමිණිල්ල මෙහිදී දිගින් දිගටම සාක්ෂිකරුගෙන් විශේෂඥතාවයක් නොමැති ක්ෂේත්‍රයක් පිළිබඳව විත්තිය විසින් මූලික ප්‍රශ්න විමසීම පිළිබඳව විරෝධතාවයක් ඉදිරිපත් කළ අතර ඊට පිලිතුරු දෙමින් විත්තියේ නීතීඥවරයා පවසා සිටියේ ඔහු විසින් කැඳවූ අක්ෂි වෛද්‍යවරයා අධිකරණය වෙත පැමිණ නොමැති බවත් එම 3 වි 4 සහ 3 වි 5 ලේඛන වල අන්තගර්තය පිළිබඳව දැනගැනීම විත්තියට ඉතා වැදගත් වන බවයි.

එහිදී පැමිණිල්ලේ විරෝධතාවය ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් පිලිගත් අතර 3 වෙනි විත්තිකරුගේ අක්ෂි රෝග වලට සාක්ෂිකරු ප්‍රතිකාර කර නොමැති හෙයින් එම ලේඛන ආශ්‍රිත ප්‍රශ්න පිළිබඳව සාක්ෂිකරුට පිළිතුරු ලබා දිය නොහැකි බව පිළිගන්නා ලදී.

එම සාක්ෂිකරු මුදාහැරීමෙන් අනතුරුව සාක්ෂියට කැඳවන ලද්දේ කෑගල්ල මහාධිකරණ රෙජිස්ට්‍රාර් වරයා වෙනුවෙන් සාක්ෂි ලබා දීමට පැමිණි තැනැත්තාය. ඔහු වයස අවු. 45 පමණ වන අධිකරණ ලිපිකරුවෙකු වූ අතර ඔහු විසින් නඩු අංක 4485/21 දරන කෑගල්ල මහාධිකරණ නඩුවේ මුල් පිටපත එදින ගෙනැවිත් තිබුනි. ඔහු මූලික ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් එම මුල් ගොනුවේ මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B 11330/18 නඩුවේ ගොනුව ඇතුලත් බවත් 2020/03/02 දින කාර්‍ය සටහනේ උගත් මහේස්ත්‍රාත්තුමන් විසින් යොදා ඇති සටහන කියවීමට අපහසු බවත් ප්‍රකාශ කළ අතර එහිදී අධිකරණය ප්‍රකාශ කලේ එම සටහන කියවීමට ඇති හැකියාව සම්බන්ධයෙන් තීරණය අධිකරණය විසින් ගන්නා බවත් ඒ අනුව එම අපැහැදිලි කොටස වෙනම සලකුනු කිරීමේ අවශ්‍යතාවයක් විත්තියට මතු නොවන බවයි. මේ වන විටත් මුල් නඩු වාරතාව සළකුනු කර ඇති ලේඛනයක් වන බැවින් එහි ඇතුලත් සියල්ල සාක්ෂි බවට පත්වන බව වැඩිදුරටත් ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විත්තියට දන්වන ලදී.

ඉන් අනතුරුව එම සාක්ෂි විමසීම අවසන් කල අතර අවස්ථා ගණනාවකදීම එම කොටස අපැහැදිළි කොටස වෙනම සළකුණු කිරීමට විත්තිය උත්සහා දැරුවත් ඊට විනිසුරු මඩුල්ල අවසර ලබා නොදුන් අතර දැනටමත් එම ගොනුව මෙම නඩුවේ සාක්ෂියක් වන බැවින් එහි එක් එක් වාක්‍ය කණ්ඩය සළකුණු කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් නොපවතින බව දන්වා සිටින ලදී. එසේම විත්තියට අවස්ථා කිහිපයකදී සාක්ෂි නීතියට අනුකූලව අනුකූල කරුණු පිළිබඳ පමණක් ප්‍රශ්න යොමු කරන ලෙස අවවාද කිරීම ද සුවිශේෂී විය.

ඉදිරි දිනයේදී 3 වන විත්තිකරුගේ සාක්ෂි ලැයිස්තුව අනුව වෛද්‍ය දීපානි වේවැල්වල යන සාක්ෂිකාරිය ගෙන්වා සාක්ෂි ලබා ගැනීම අවසන් කරන බව දන්වා සිටි අතර පැමිණිල්ල වෙනුවෙන් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවයක් හරහා සාක්ෂිකරුවන් කිහිපදෙනෙකු කැඳවීමට බලාපොරොත්තු වන බව පවසන ලදී. ඒ අනුව 3 වන විත්තියේ සාක්ෂිකාරියද ඒ අයුරින් කැඳවීමට විත්තිය එකඟ වූ අතර ඊට අවශ්‍ය පහසුකම් සපයන ලෙස මහාධිකරණ රෙජිස්ට්‍රාර් වෙත නියෝග කරන ලදී. ඉන් අනතුරුව 3 විත්තිය වෙනුවෙන් 17 වන

සාක්ෂිකාරියට හා පැමිනිල්ල වෙනුවෙන් 28,53,54,55,61 සාක්ෂිකරුවන්ට ඉදිරි දින පෙනී සිටීමට සිතාසි නිකුත් කරන ලදී. එම සිතාසි පුත්තලම මහාධිකරණ විනිසුරුතුමිය මඟින් නිකුත් කරවා ගැනීමට ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල තීරණය කරන ලදී.

3. **Any significant observations inside court room and outside?** නැත

**4. Next date & time: 2024.07.16 / 2024.07.17**